සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන
රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், வியாபார அபிவிருத்தி மற்றும்
கீழுமைப்பு பயன்பாட்டு அரச வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment, Business Development and Underutilized State Resources Development

| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HO/02/Ad/12/වා:/ස්.මා/2021 | | 2020.08.26 |

**සමෘද්ධි දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 2020/09**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ වරුන්
සමෘද්ධි කළමනාකරුවන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ඇතුළු සියළු නිලධාරීන් වෙත.

**<u>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කරන දෙපාර්තමේන්තුගත නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු ක්‍රියාවලිය - 2021</u>**

සියළුම රාජ්‍ය නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු ක්‍රියාත්මක විය යුත්තේ මාරු මණ්ඩල පිහිටුවා එම නිර්දේශ මතය. මේ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII වන පරිච්ඡේදයේ අදාළ විධි විධාන අනුව කටයුතු කළ යුතු අතර ස්ථානමාරු මණ්ඩල සඳහා වෘත්තීය සමිති නියෝජනය එම රීති සංග්‍රහයේ විධිවිධාන අනුව ඊට ඇතුළත් කර ගත යුතුය.

2021 වර්ෂය සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත සියළු නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු ඉහත විධි විධාන වලට යටත්ව මේ සමඟ ඉදිරිපත් කර ඇති වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය අනුව ක්‍රියාත්මක කළ යුතුය.

දීප ව්‍යාප්ත සේවා හා ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් ප්‍රධාන කාර්යාලය හරහා සිදු කරනු ලැබේ.

එකම සේවා ස්ථානයක <u>වසර 05 කට වැඩි කාලයක් සේවය කර</u> ඇති දෙපාර්තමේන්තුගත සියළු නිලධාරීන් අනිවාර්යයෙන්ම වාර්ෂික ස්ථාන මාරුවීම් ඉල්ලුම් කළ යුතුය. එලෙස ස්ථාන මාරුවීම් ඉල්ලුම් නොකරන නිලධාරීන් මාරු මණ්ඩල තීරණවලට හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටි රීති වලට එරෙහිවීම මත මාරු මණ්ඩලය විසින් එවැනි නිලධාරීන් සම්බන්ධයෙන් පවතින පුරප්පාඩු හා සේවා අවශ්‍යතාවය සළකා බලා ස්ථාන මාරු කරනු ලැබේ. මාරු මණ්ඩලය විසින් ලබාදෙන ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් පිළිගත හැකි අභියාචනා මත පමණක් යම් සහනදායී තීරණයක් ලබාදීම පිළිබඳව අභියාචනා මණ්ඩලය සළකා බලනු ලැබේ.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

**<u>ස්ථානමාරු මණ්ඩල පහත දැක්වෙන පරිදි කොටස් තුනකින් සමන්විත වේ.</u>**

1. අන්තර් දිස්ත්‍රික්ක මාරු මණ්ඩලය
2. දිස්ත්‍රික්කය තුළ මාරුවීම් සඳහා දිස්ත්‍රික්ක මාරු මණ්ඩලය
3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මාරුවීම් සඳහා ප්‍රාදේශීය මාරු මණ්ඩල

**අන්තර් දිස්ත්‍රික් ස්ථානමාරු මණ්ඩල සංයුතිය.**

| | | | |
|---|---|---|---|
| 1. | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) | - | (සභාපති) |
| 2. | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) | - | (සාමාජික) |
| 3. | පරිපාලන නිලධාරී (පාලන) | - | (ලේකම්) |
| 4. | වෘත්තීය සමිති නියෝජනය | - | (නියෝජිතයන්) |

**දිස්ත්‍රික් ස්ථානමාරු මණ්ඩල සංයුතිය**

| | | | |
|---|---|---|---|
| 1. | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ | - | (සභාපති) |
| 2. | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | - | (සාමාජික) |
| 3. | ආයතන කළමනාකරු | - | (ලේකම්) |
| 4. | වෘත්තීය සමිති නියෝජනය | - | (නියෝජිතයන්) |

දිස්ත්‍රික් මාරු මණ්ඩලය දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කළ යුතුය.

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ස්ථානමාරු මණ්ඩල සංයුතිය අවම වශයෙන් සාමාජිකයන් 04 ක් වත් විය යුතුය.**

| | | | |
|---|---|---|---|
| I. | ප්‍රාදේශීය ලේකම් | - | (සභාපති) |
| II. | ගණකාධිකාරී | - | (ලේකම්) |
| III. | මූලස්ථාන සමෘද්ධි කළමණාකරු / මහා සංගම් | - | (සාමාජික) |
| | සමෘද්ධි කළමනාකරු දෙදෙනාගෙන් එක් අයෙක් | - | (සාමාජික) |
| IV. | වෘත්තීය සමිති නියෝජිතයන් | | |

❖ ස්ථාන මාරු මණ්ඩල වෙත ඉදිරිපත් කළ යුතු ලේඛන

I. ස්ථාන මාරු අයදුම් පත්‍රය
II. වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ලේඛනය (02 ආකෘතිය අනුව)
III. **<u>එකම සේවා ස්ථානයක අවුරුදු 05 ට වැඩි</u>** සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින්ගේ ලේඛනය. (03 ආකෘතිය අනුව)

**<u>අභියාචනා මණ්ඩල</u>**

ඉහත එක් එක් මාරු මණ්ඩල සඳහා අභියාචනා මණ්ඩලයක් ද පත් කළ යුතුය. නිලධාරින්ගේ ඉල්ලීම් මත මාරුවීම් හෝ සේවා අවශ්‍යතාවය මත වන මාරුවීම් හේතුවෙන් අතෘප්තියට පත්වන නිලධාරින්ට මෙම අභියාචනා මණ්ඩලවලට මෙහි නිශ්චිතව සඳහන් කර ඇති කාල වකවානු නොඉක්මවා අභියාචනා කිරීමට අවස්ථාව ලබාදිය යුතුය.

අභියාචනා මණ්ඩලයේ සභාපති අනිවාර්යෙන්ම දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විය යුතු අතර, ඉතිරි නියෝජිතයින් දිස්ත්‍රික් මාරු මණ්ඩලයේ නිලධාරින්ම පත් කර ගැනීමට දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ට බලය පවරනු ලැබේ.

ස්ථානමාරු ලබා දීමේ දී හැකි සෑම විටකම නිලධාරියාට පෞද්ගලික දුෂ්කරතා අවම වනසේ, ස්ථාන මාරු කිරීම කළ යුතුය. එසේ වුවත් සේවා අවශ්‍යතාවය ප්‍රමුඛ විය යුතු බව ද විශේෂයෙන්ම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ඉටු කෙරෙන සියළුම සංවර්ධන කාර්යයන්ට බාධාවක් නොවන ලෙස ස්ථානමාරු සැළසුම් කිරීම කළ යුතුය.

<u>ස්ථානමාරු කාල සටහන</u>

- අගෝස්තු 31 ට පෙර ස්ථාන මාරු මණ්ඩල පත් කිරීම හා ස්ථාන මාරු පටිපාටිය සකස් කිරීම.
- සැප්තැම්බර් මස 05 ට පෙර ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම. (මාරු කිරීමේ පරිපාටියට අනුකූලව ඉදිරිපත් කරන ඉල්ලීම් පමණක් පිළිගනු ලැබේ.)
- සැප්තැම්බර් 25 දිනට පෙර අදාළ නිලධාරියා වෙත ස්ථාන මාරු තීරණ දැන්වීම
- ඔක්තෝම්බර් 05 දින තෙක් අභියාචනා භාර ගැනීම.
- ඔක්තෝම්බර් 25 දිනට පෙර අභියාචනා මණ්ඩල තීරණ නිලධාරියා වෙත දැනුම් දීම.
  **(කොරෝනා වසංගතය හා පාර්ලිමේන්තු මහ මැතිවරණය නිසා සාමාන්‍ය පටිපාටියෙන් බැහැරව ඉහත කාලවකවානු සකස්කර ඇති අතර, සියළු කටයුතු 2020 දෙසැම්බර් 31 දිනට අවසන් කළ යුතුය.)**

**නිලධාරින්ගේ වගකීම්.**

I. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියළුම නිලධරයන් නියමිත දිනයේදී නව රාජකාරී ස්ථාන වෙත සේවය සඳහා වාර්තා කළ යුතුය.

II. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 අති විශේෂ ගැසට් පත්‍රයේ කාර්යය පටිපාටික රීති 214, 215, 216, 217 වගන්තිවල සඳහන් විධි විධාන බලපැවැත්වෙනු ඇත.

III. මෙම චක්‍රලේඛයේ දක්වා නොමැති විධිවිධාන සම්බන්ධයෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වේ.

IV. මෙම චක්‍රලේඛය අංක 1589/30 දරණ 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII පරිච්ඡේදයේ 202 වගන්තිය අනුව නිකුත් කරනු ලැබේ.

V. ඒකාබද්ධ සේවා නිලධාරින්ගේ හා දීපව්‍යාප්ත සේවාවලට අයත් නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු සිදු කිරීමේදී අදාළ ඉල්ලීම් ඔබගේ නිර්දේශ සහිතව මා මඟින් අදාළ අමාත්‍යාංශ හා ආයතන වෙත ඉදිරිපත් කළ යුතුය.

ස්ථාන මාරු ඉල්ලුම් පත්‍රයේ සඳහන් සියලු තොරතුරු නිවැරදිව සැපයීමට අදාළ නිලධාරින් වගබලා ගත යුතු අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සළකා බලනු නොලැබේ. එහෙත් ප්‍රමාද වී ස්ථාන මාරු ඉල්ලුම් කරනු ලබන අයගේ සේවා කාලය සැලකිල්ලට ගෙන අදාළ නිලධාරින් පුරප්පාඩු පවතින දිවයිනේ ඕනෑම සේවා ස්ථානයකට ස්ථාන මාරු කිරීමට ලක්විය හැකිය.

ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල / ප්‍රාදේශීය ලේකම් කාර්යාල බැංකු සහ වසම් ඒකක යන සියළු ස්ථානවල නියමිත සේවක සංඛ්‍යාවට අතිරික්තව කිසිම නිලධාරියෙකු රඳවා ගැනීම සිදු නොකළ යුතු බවද කාරුණිකව දන්වා සිටිමි.

මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සළකමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා - කා.දැ.ගැ.ස.
   ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

**<u>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව</u>**

**<u>දෙපාර්තමේන්තුගත නිලධාරින්ගේ වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්තිය - 2021</u>**

2021 වර්ෂය ආරම්භයේ දී ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇති සමෘද්ධි කළමණාකරු හා සමෘද්ධි සංවර්ධන නිලධාරි වාර්ෂික ස්ථානමාරු වැඩසටහනේ දී උපයෝගි කර ගන්නා ප්‍රතිපත්තිය පහත දැක්වේ.

**01. වාර්ෂික ස්ථානමාරු ඉල්ලා සිටීමට හිමිකම් ලබන නිලධාරින්**

i. **<u>වසර 05 කට වැඩි කාලයක්</u>** එකම සේවා ස්ථානයේ සේවය කර ඇති නිලධාරින් වෙනත් සේවා ස්ථානයකට ස්ථාන මාරු කළ යුතු අතර, එසේ නොකිරීමෙන් යම් අහිතකර ප්‍රතිඵල ඇතිවන්නේ නම් එහි වගකීම ආයතන ප්‍රධානීන් වෙත ද පැවරෙනු ඇත.

ii. මුල් පත්වීම් දිනයේ සිට අවම වශයෙන් අවුරුදු 03 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින්

iii. ප්‍රිය මනාප සේවා ස්ථානයක වසර තුනක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින්

iv. ප්‍රිය මනාප සේවා ස්ථානයක වසර දෙකක් සේවය කර ඇති නිලධාරින් මුළු සේවා කාලය නොසළකා දුෂ්කර සේවා ස්ථානමාරු ඉල්ලා ඇති විට දී.

**02. වාර්ෂික ස්ථාන මාරු සඳහා නිලධාරින් විසින් ඉල්ලීම් නොකරන ලද අවස්ථාවකදී සේවා අවශ්‍යතාවය මත පහත සඳහන් නිලධාරින් වාර්ෂික ස්ථාන මාරුවලට යටත් වේ.**

2.1. **<u>කිසියම් සේවා ස්ථානයක වසර 05 ක්</u>** හෝ ඊට වැඩි කාලයක් සේවය සම්පූර්ණ කර ඇති නිලධාරින්

2.2. වාර්ෂික ස්ථාන මාරු ලැබීමට හිමිකම් ඇති නිලධාරින් සඳහා අනුප්‍රාප්තිකයන් යෙදීමේ දී ඉහත 2.1 නිලධාරින් ඒ සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය.

**03. නිලධාරින්ගේ වාර්ෂික ස්ථානමාරුවීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.**

3.1. හැකි සෑම විටම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති ස්ථාන මාරු ඉල්ලීම් 03 න් අනුපිළිවෙලට ප්‍රමුඛතාවය ලැබෙන පරිදි ඉන් එකකට ස්ථානමාරු කිරීම.

3.2. ඉල්ලුම්කරු හා කලත්‍රයා යන දෙදෙනාම රාජ්‍ය සේවයේ නියුක්ත නම් එකම ප්‍රදේශයක සේවය කිරීමට අවස්ථාව ලබාදීමට උපරිම උත්සාහ කිරීම.

3.3. සෑම ස්ථාන මාරුවක්ම ජනවාරි 01 දින සිට බල පැවැත්වෙන ක්‍රියාත්මක කළ යුතු අතර, අනුප්‍රාප්තිකයා පැමිණෙන තෙක් ප්‍රමාද නොකර ස්ථාන මාරු නියෝග ලද නිලධාරීන් නියමිත දිනට නව සේවා ස්ථානයේ රාජකාරි සඳහා වාර්තා කළ හැකි පරිදි මුදාහැරීම සඳහා සෑම ආයතන ප්‍රධානියකු විසින්ම කටයුතු කළයුතුය. කෙසේ වුවද විශේෂ රාජකාරි කටයුත්තක අවශ්‍යතාමත පමණක් ඉහත ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේ දිනය උපරිම ලෙස මාසයක කාලයක් ප්‍රමාද කිරීමට ස්ථාන මාරු මණ්ඩලයට බලය පවනු ලැබේ.

3.4. ප්‍රිය මනාප නොවන සේවා ස්ථාන සඳහා සේවා අවශ්‍යතාවය මත නිලධාරින් මාරු කිරිමේ දී පළමුව අවිවාහක නිලධාරින් ද, දෙවනුව අනෙකුත් නිලධාරින්ද වශයෙන් තෝරා ගැනීම.

3.5. වයස අවුරුදු 58 ඉක්මවන ලද නිලධාරින්ගේ ඉල්ලීම මත හැර දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකිරීම (එසේ වුවද විනය කරුණු සඳහා මෙය අදාළ නොවේ.)

3.6. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ විෂය පථයට අයත් වන නිලධර කණ්ඩායම් වලට හා සේවාවට අයත් රජයේ නිලධරයන්ගෙන් අවම වශයෙන් 15% ක නියෝජනයක් සහිත සෑම වෘත්තිය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙක්. මාරු මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත්කළ යුතුය.

3.7. ප්‍රිය මනාප සේවා ස්ථානවල සේවය කරන නිලධාරීන් තවත් ප්‍රිය මනාප සේවා ස්ථානයකට කරනු ලබන ඉල්ලීම් සළකා බලන්නේ ප්‍රිය මනාප නොවන සේවා ස්ථානවල සේවය කළ නිලධාරින්ගේ ඉල්ලීම සළකා බැලීමෙන් පසුවය.

3.8. සමාජ සංවර්ධන සහකාරවරුන් හා සමාජ ආරක්ෂණ නිලධාරීන් ස්ථාන මාරු කිරීමේ දී හැකි සෑම විටම ආයතනයේ පැවැත්මට බාධාවක් නොවන සේ ස්ථාන මාරු කිරීම.

3.9. කිසියම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් තුළ ක්ෂුද්‍ර මූල්‍ය බැංකුවල සේවය කරන නිලධාරීන් ස්ථාන මාරු කිරීමේ දී බැංකු රාජකාරි වලට බාධා සිදු නොවන පරිදි දිස්ත්‍රික්කය තුළ අන්තර් බැංකු අතරම පමණක් මාරුකළ යුතුය. සුවිශේෂී හේතුවක් මත දිස්ත්‍රික් අධ්‍යක්ෂකගේ නිර්දේශය සහිතව මාගේ අනුමැතිය ඇතිව බැංකුවල සේවය කරන නිලධාරීන් ක්ෂේත්‍රයට ස්ථාන මාරු කිරීමත් ක්ෂේත්‍රයේ සිටින නිලධාරීන් බැංකු වලට ස්ථාන මාරු කිරීමත් කළ යුතුය.

3.10. දිස්ත්‍රික්කය තුළ ආයතන හා වැටුප් විෂය භාරව කටයුතු කරන නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට යටත් කළ යුතු බැවින් එම විෂය පිළිබඳ වෙනත් නිලධාරීන් පුහුණු කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක් සේ සළකා ක්‍රියාත්මක කල යුතුය.

**04. වසම් මට්ටමේ සේවය කරන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ස්ථාන මාරු කිරීමේ දී ඔවුන්ගේ ඉල්ලීමක් ඇති විටක හැර හැකි සෑම විටකම එම නිලධාරීන් අදාළ කලාපයේ ආසන්නතම වසමකට ස්ථාන මාරු ලබා දීමට කටයුතු කළ යුතුය. එසේ වුවද යම් නිලධාරියෙකු විනය හේතූන් මත කලාපයෙන් පිටත වෙනත් කලාපයකට හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් පිටත ස්ථාන මාරු කළ හැකිය.**

<u>පහත දැක්වෙන ස්ථානමාරුවීම් සඳහා මාරු මණ්ඩල නිර්දේශ අවශ්‍ය නොවේ.</u>

1. කාර්ය ස්ථානයේ වෙනසක් නොවන ස්ථාන මාරුවීම්
2. විනය හේතු මත කෙරෙන ස්ථාන මාරුවීම්
3. සේවා අවශ්‍යතාවය මත කළ යුතු ස්ථාන මාරුවීම්
4. රජයේ නිලධාරින්ගේ ඉල්ලීම් මත කරනු ලබන සුහද ස්ථානමාරු

සේවා අවශ්‍යතාවය මත කරන ස්ථාන මාරුවීම් අදාළ වෘත්තිය සමිති නියෝජිතයන් වෙත දැන්විය යුතුය.

ප්‍රජා මූල බැංකු හා බැංකු සංගම්වල නිලධාරීන් සේවා අවශ්‍යතාවය මත ස්ථාන මාරු කිරීමේදී අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍යගේ නිර්දේශය ලබාගත යුතුය.

විගණන අංශයට අනුයුක්ත කළමණාකරුවන්ගේ ස්ථාන මාරුවීම් සඳහා ඉහත පරිපාටිය මෙන්ම ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ නිර්දේශය සැළකිල්ලට ගත යුතුය.

විමර්ශන අංශයට අනුයුක්ත කලමනාකරුවන්ගේ ස්ථාන මාරුවීම්වලදී සහකාර අධ්‍යක්ෂ (විමර්ශන) ගේ නිර්දේශ ලබා ගත යුතුය.

අන්තර් දිස්ත්‍රික් ස්ථානමාරු ලැබූ නිලධාරීන්ගේ ලේඛන ඔක්තෝබර් 30 දින වනවිට ඒ ඒ දිස්ත්‍රික් කාර්යාල වලට එවීමට කටයුතු කරනු ලැබේ.

එහෙත් එම ලේඛන ලැබීමට පෙර වුවද ඔබගේ මාරුවීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට එය බාධාවක් කර නොගත යුතුය.

ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත්‍ර පිළිබඳ සළකා නොබලන අතර ස්ථානමාරු සඳහා අවසන් තීරණය ගැනීමේ බලය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

**සේවා කාලය ගණනය කිරීම**

වාර්ෂික ස්ථාන මාරුවලදී කාලය ගණනය කරනු ලබනුයේ පෙර වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනටය (2021 වාර්ෂික ස්ථාන මාරු වීම සඳහා 2020.12.31 දිනට)

වා.ස්.මා.01

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත නිලධාරින් අන්තර් දිස්ත්‍රික්, දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ස්ථාන මාරු කිරීමේ අයදුම්පත**

| අන්තර් දිස්ත්‍රික්ක | දිස්ත්‍රික්කය තුළ | ප්‍රා.ලේ.කොට්ඨාසය |
|---|---|---|

**(අදාළ නොවන කොටුව කපා හරින්න)**

01. නිලධාරියාගේ සම්පූර්ණ නම :- ......................................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය :- ......................................................................................................

03. තනතුර :- ......................................................................................................

04. වර්තමාන සේවා ස්ථානය (මූලස්ථාන/වසම/බැංකුව/මහාසංගමය/ක්ෂුද්‍ර මූල්‍ය බැංකුව ආදී වශයෙන්) :-

......................................................................................................................................................

05. උපන් දිනය :- ......................................................................................................

06. 2020.12.31 දිනට වයස :- ......................................................................................................

07. ස්ත්‍රී පුරුෂ භාවය :- ......................................................................................................

08. නිලධාරියා පදිංචි ස්ථානය :-
   i. ස්ථිර ලිපිනය :- ......................................................................................................
   ii. තාවකාලික ලිපිනය :- ......................................................................................................

09. සේවා විස්තර
   i. සේවයට බැඳුනු දිනය :- ..................................................................
   ii. මුල් සේවා ස්ථානය :- ..................................................................
   iii. සේවයට බැඳුනු මධ්‍යය :- ..................................................................

| සිට - දක්වා | මුළු සේවා කාලය (වසර) | සේවා ස්ථානය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

**(සියළුම සේවා කාල අඛණ්ඩව සටහන් කරන්න)**

10. නිලධාරියා විවාහක, අවිවාහක, වැන්දඹු, දික්කසාද බව :- ..................................................................
   i. විවාහක නම් කලත්‍රයාගේ නම :- ..................................................................
   ii. කලත්‍රයා රැකියාවක නියුතු නම්,
   සේවය කරන අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / වෙනත් :- ..................................................................
   iii. තනතුර :- ..................................................................
   iv. සේවා ස්ථානය :- ..................................................................
   v. දරුවන් ගණන හා ඔවුන්ගේ වයස :-
      1. ..................................................................
      2. ..................................................................
      3. ..................................................................
      4. ..................................................................

vi. පාසල් යන දරුවන් වෙතොත් ඔවුන් දැනට ඉගෙනුම ලබන පාසල් :-

1. .......................................................................................
2. .......................................................................................
3. .......................................................................................
4. .......................................................................................

11. i. අන්තර් දිස්ත්‍රික් ස්ථාන මාරු වලදි මාරුවීමට කැමති දිස්ත්‍රික්ක 03 ක් පිළිවෙලින් නම් කරන්න. ප්‍රධාන කාර්යාලයට ද ඉල්ලුම් කළ හැකිය (අන්තර් දිස්ත්‍රික් ස්ථාන මාරුවීම් ඉල්ලා ඇති නිලධාරින් පමණයි)

1. ................................................................
2. ................................................................
3. ................................................................

ii. දිස්ත්‍රික්කය තුළ ස්ථාන මාරුවීම් වලදී සේවය කිරීමට කැමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 03 ක් නම් කරන්න. (දිස්ත්‍රික්කය තුළ ස්ථාන මාරුවීම් ඉල්ලා ඇති නිලධාරින් සඳහා පමණි.)

| **දිස්ත්‍රික්කය** | **ප්‍රා.ලේ.කොට්ඨාසය** |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |

iii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ස්ථාන මාරුවීම් වල දී බැංකු හෝ වසම 03 ක් නම් කරන්න. මහා සංගමය හා මූලස්ථානය ද ඉල්ලුම් කළ හැකිය. (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ස්ථාන මාරුවීම් ඉල්ලීම් කළ නිලධාරින් සඳහා පමණි.

1. ................................................................
2. ................................................................
3. ................................................................

12. ස්ථාන මාරුවීම් ඉල්ලීමට හේතුව කෙටියෙන් පැහැදිලිව සඳහන් කරන්න.

..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බවට ප්‍රකාශ කරමි.

.................................................... ....................................................

දිනය අයදුම්කරුගේ අත්සන

**<u>අන්තර් දිස්ත්‍රික්ක / දිස්ත්‍රික්ක තුළ / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ නිර්දේශය</u>**

අදාළ නොවන කොටස කපා හරින්න.

**දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ**

සුදුසු අනුප්‍රාප්තියකු සහිතව / රහිතව ස්ථාන මාරුවීම නිර්දේශ කරමි / නොකරමි

.................................................... ....................................................

දිනය ප්‍රාදේශීය ලේකම්

**<u>අධ්‍යක්ෂ ජනරාල් (සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව)</u>**

සුදුසු අනුප්‍රාප්තියෙකු සහිතව / රහිතව ස්ථාන මාරුවීම නිර්දේශ කරමි / නොකරමි.

.................................................... ....................................................

දිනය දිස්ත්‍රික් ලේකම් (දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ)

<u>මාරු මණ්ඩල නිර්දේශය</u>

සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිත / රහිතව ස්ථාන මාරුවීම නිර්දේශ කරමි / නොකරමි.

............................................ ............................................

මාරු මණ්ඩල ලේකම් මාරු මණ්ඩල සභාපති

............................................ ............................................

දිනය දිනය

**මාරු මණ්ඩල සාමාජිකයාගේ නම අත්සන**

1. ................................................................ ................................
2. ................................................................ ................................
3. ................................................................ ................................
4. ................................................................ ................................